# කර්ම ශක්තිය හා තාප ශක්තිය

මේ ලිපිවල පදනම නැවතත් සඳහන් කළයුතු වන්නේ නිරවුල් අවබෝධය සඳහා ඒ වැදගත්වන බැවින් ය. මනෝකාය ඇතැම් පුද්ගලයන්ගේ මනසට හා වෙනත් ඉන්ද්‍රියන්ට ගෝචර වන්නේ ය යන පදනමේ සිට මේ ලිපි ලියැවෙයි. මනෝකාය ගෝචරවන්නේ ඇතැම් පුද්ගලයන්ගේ මනසට පමණක් නම් පදනම වෙනස්වන බැවින් මෙහි සඳහන් නිගමන ද වෙනස් වෙයි. අපට යමක් ඉන්ද්‍රිය ගෝචර වන්නේ ය යන්නෙන් කියැවෙන්නේ ඒ ඉන්ද්‍රිය ගෝචරවන දේ මනස හා අනෙක් ඉන්ද්‍රිය විසින් ගැනෙන්නේ ය යන තේරුමෙන් ය. මනස නොමැතිව අනෙක් ඉන්ද්‍රියවලට පමණක් කිසිවක් ගෝචර නො වෙයි.

මනෝකාය  ඇතැම් පුද්ගලයන්ට පෙනෙන්නේ (දැනෙන්නේ) නම් එහි තේරුම ඒ පුද්ගලයන්ගේ මනසට හා වෙනත් ඉන්ද්‍රියකට හෝ ඉන්ද්‍රිය කිහිපයකට හෝ දැනෙන යම් දෙයක් ඇති බව ය. මෙහි යම් දෙයක් ඇතැයි යනුවෙන් ගැනෙන්නේ අනෙක් අවස්ථාවල දී මෙන් ම පරමාර්ථ වශයෙන් නොව සම්මුති වශයෙන් බව අවධාරණය කළයුතු වෙයි. එලෙස සැලකූ කල මනෝකාය ඉතා සියුම් ද්‍රව්‍යයකින් නිර්මිත වූවක් යැයි හෝ ඉන්ද්‍රිය ගෝචර විකිරණ වර්ගයකින් නිර්මිත වූවක් යැයි උපකල්පනය කළහැකි ය. ඒ උපකල්පනය ඇතැම් පුද්ගලයන්ගේ නිරීක්ෂණ හා අනෙක් දේ සමග සංගත වන බැවින් එය සම්මුති වශයෙන් නිවැරදි වෙයි. කිරිලියන් ඡායාරූප සම්බන්ධයෙන් ද කිවහැකි වනුයේ එවැනි කරුණකි.

එහෙත් මනස එසේ නො වෙයි. මනස, මනසක් ලෙස දුටු අයකු නැත. කිරිලියන් ක්‍රමයට හෝ වෙනත් ආකාරයකට හෝ මනසේ ඡායාරූප ගත් අයකු ද නැත. මනස බටහිර විද්‍යාවේ සඳහන්වන ආකාරයේ ශක්තියක් ලෙස ගැනීම නිවැරදි නො වෙයි. බටහිර විද්‍යාවේ චාලක ශක්තිය, විභව ශක්තිය (ගුරුත්වාකර්ෂණ, විද්‍යුත් ස්ථිතික ආදී වශයෙන්), තාප ශක්තිය ආදී ශක්ති වෙයි. එමෙන් ම අයින්ස්ටයිනීය භෞතික විද්‍යාවට අනුව ද්‍රව්‍යය (ස්කන්ධය) හා විකිරණය ශක්ති විශේෂ වෙයි. ස්කන්ධය විකිරණය බවට ද, විකිරණය ස්කන්ධය බවට ද පත්කරගත හැකි ය.

අපි ඇතැම් විට මානසික ශක්තිය යන්න යොදාගන්නා බව සැබෑ ය. එහෙත් එය බටහිර වියාවේ දැක්වෙන ආකාරයේ ශක්තියක් ලෙස ගැනීම වැරදි ය. බටහිර විද්‍යාවේ ශක්තිය සංස්ථිතික වෙයි. බටහිර විද්‍යාවට අනුව ශක්තිය නිර්මානයකිරීමට හෝ විනාශකිරීමට හෝ නො හැකි ය. විභව ශක්තිය චාලක ශක්තිය බවට, විද්‍යුත් ශක්තිය තාප ශක්තිය බවට ආදී වශයෙන් ශක්තිය එක් ආකාරයක සිට තවත් ආකාරයකට පත්විය හැකි ය. එහෙත් සමස්ත (මුළු) ශක්තිය නො වෙනස් ව පවතියි. මානසික ශක්තිය යන වචන යොදාගත්ත ද, වෙනත් ශක්තියක් මානසික ශක්තිය බවට පත්කරගත නො හැකි ය.

ඇතැම් විට කෙනකු පවසනු ඇත්තේ මානසික ශක්තියේ ආධාරයෙන් ද්‍රව්‍යය චලනයකිරීම, ඈත තිබෙන භාණ්ඩයක් (හැන්දක්) නැවීම ආදී දේ කළහැකි බව ය. මේ දේ කළහැකි යැයි අප උපකල්පනය කළත්, ඒ එසේ සිදුවන්නේ කෙසේ ද යන්න නිව්ටෝනීය මෙන් ම ක්වොන්ටම් භෞතිකය ද යොදා නොගනිමින් පැහැදිලි කළයුතු වෙයි. මනස ආධාරයෙන්, මානසික සිතුවිල්ලක් යොදාගනිමින් යම් දුරකින් වූ වස්තුවක් නිශ්චලතාවයේ තිබී චලනය කෙළේ යැයි සිතමු. නිව්ටෝනීය භෞතික විද්‍යාවට අනුව එහි දී වස්තුවට ත්වරණයක් ලැබෙන බැවින් ඒ මත බලයක් යෙදවිය යුතු ය. නිව්ටෝනීය භෞතික විද්‍යාව දන්නේ එක්කෝ වස්තුව සමග ස්පර්ශවන බලයක් (තල්ලුකිරීම, ඇදගෙන යෑම) යෙදීම හෝ චුම්බකයක් ක්ෂෙත්‍රයක් ආධාරයෙන් අල්පෙනෙත්තක් මත ඇතිකෙරෙන ආකාරයෙන් බලයක් යෙදීම ය.

අනෙක් අතට ක්වොන්ටම් භෞතික විද්‍යාවේ දී අංශුවක් වෙනත් අංශුවක් සමග පැටලී ඇත්නම් (entangled) එවිට ඒ අංශු දෙක කෙතරම් ඈතකින් තිබුණ ද එකක් නිසා අනෙක මත බලපෑමක් ඇතිවිය හැකි ය. එහෙත් මනස ද්‍රව්‍යමය වූ අංශුවක් සමග එලෙස නො පැටලෙයි. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ දී ඕනෑම අංශුවකට වෙනත් ඕනෑම අංශුවක් සමග පැටලිය හැකි නො වෙයි. අංශු පැටලෙන්නේ යම් අවශ්‍යතා අනුව ය. උදාහරණයක් ලෙස විකිරණයෙන් සමගාමීව නිර්මානය කෙරෙන අංශු දෙකක් පැටලීමට හැකි වෙයි. මනසට එවැනි පැටලීම් ඇතිකරගැනීමට හැකිකමක් නැත.

© Prof. Nalin De Silva

ඉහත සඳහන් කරුණුවලින් පැහැදිළි විය යුත්තේ මානසික ශක්තිය යන්න ව්‍යවහාරයේ තිබුණ ද ඒ ශක්තිය බටහිර විද්‍යාවේ කියැවෙන ශක්ති සමග සංසන්දනය කළ නොහැකි බව ය. කර්ම ශක්තිය ගැන ද කිවයුත්තේ එවැනි ම දෙයකි. මානසික ශක්තිය මෙන් ම කර්ම ශක්තිය ද, බටහිර විද්‍යාවේ කියැවෙන ආකාරයේ භෞතික වූ ශක්තියක් නො වෙයි. කර්ම ශක්තිය භෞතික වූ ආකාරයකට තාප ශක්තිය බවට පත්කරගත හැකි ද? එසේ කළහැකි නම් ශක්ති සංස්ථිති නියමය එහි දී වලංගුවන්නේ ද? ඒ ප්‍රශ්නවලට පැහැදිළි පිළිතුර නම් නැත යන්න ය. කර්ම ශක්තිය තාප ශක්තිය බවට පත්කරගත හැකි නම් තාප ශක්තිය කර්ම ශක්තිය බවට ද පත්කරගැනීමට හැකිවිය යුතු ය. එවැන්නක් උපකල්පනය කළහොත් සත්ත්වයකුගේ පුනබ්භවය තීරණයකිරීමේ හැකියාව ද තාප ශක්තියට හා වෙනත් එවැනි භෞතික ශක්තීන්ට හිමිවනු ඇත.

ඉංගිරිසියෙන් Energy යන්නෙන් කියැවෙන්නට සිංහලෙන් ශක්තිය යන්න යෙදීම හේතුවෙන් ද මේ තත්ත්වය ඇති වී තිබෙන බව පැහැදිළි ය. කර්ම ශක්තිය හෝ මානසික ශක්තිය හෝ එවැනි භෞතික ශක්තියක් නො වෙයි. එහෙත් අවාසනාවකට දැන් අපි එහි අනෙක් පැත්ත ද යොදාගන්නෙමු. අද බොහෝ දෙනා කර්ම ශක්තිය හා මානසික ශක්තිය ඉංගිරිසියට Karmic Energy හා Mental Energy යනුවෙන් පරිවර්තනයකිරීමට පුරුදු වී සිටිති. මේ සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස බටහිර විද්‍යාවට යටවූ යම්කිසිවකු නිවන් දැකීම යනු කර්ම ශක්තිය හා මානසික ශක්තිය, තාප ශක්තිය වැනි වෙනත් ශක්තියක් බවට පත්කිරීම යැයි පැවසුවහොත් පුදුම නොවිය යුතු ය.

කර්ම ශක්තිය හා මානසික ශක්තිය බටහිර විද්‍යාවේ ඉගැන්වෙන ශක්තීන්ගෙන් වෙනස් ශක්තියක් ලෙස ගැනීමට අප පුරුදු විය යුතු ය. වඩා සුදුසු ක්‍රමය නම් Enrgy යනුවෙන් කියැවෙන්නට ශක්තිය නොමැතිව වෙනත් වචනයක් යොදාගැනීම ය. එහෙත් ඒ සිදුවේ යැයි සිතීමට නොහැකි බැවින් ශක්තිය යන වචනය යොදාගැනීමේ දී සිහියෙන් කටයුතුකිරීමට වගබලාගත යුතු ය. ඒ සමග අපට කළහැකි තවත් දෙයක් වෙයි. ඒ මානසික ශක්තිය යොදාගෙන භෞතික කාර්යයන්කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ අපේ ප්‍රවාද ගොඩනැගීම ය.

මනස යනු ද්‍රව්‍යයෙන් මුළුමනින් ම වෙන්වූවක් නො වෙයි. මනස නොමැතිව අපට ද්‍රව්‍යය දැකීමට (දැකීම යන්නෙන් මෙවැනි අවස්ථාවල ඇස හැරෙන්නට වෙනත් ඉන්ද්‍රියක් යොදාගනිමින් දැනගැනීම ද කියැවෙයි.) නො හැකි ය. නිර්මානාත්මක සාපේක්ෂතාවාදයට අනුව ද්‍රව්‍යය යන්න නිර්මානයකරන්නේ ද මනස ය. එහි දී ද්‍රව්‍යය පමණක් නොව මනස ද නිර්මානයකෙරෙන්නේ මනස විසින් ම ය. ඒ අර්ථයෙන් ද්‍රව්‍යය හා මනස බැඳී ඇත. එමෙන් ම මනස පමණක් යොදාගනිමින් භෞතික වස්තූන් චලනයකළහැකි බව අපි පිළිගනිමු. එහෙත් ඉන් අදහස් වන්නේ බටහිර භෞතික විද්‍යාවේ දී චුම්බකයක් විසින් චුම්බක ක්ෂෙත්‍රයක් ඇතිකෙරෙන අන්දමින් මනස විසින් මානසික ක්ෂෙත්‍රයක් ඇතිකෙරෙන්නේ ය යන්න නො වෙයි. අපට ඒ තේරුම්ගැනීම සඳහා වෙනත් ප්‍රවාදයක් අවශ්‍ය වෙයි.

බටහිර දර්ශනයෙහි ඩෙකාටෙ පඬිවරයා කළ අන්දමට මනස ද්‍රව්‍යයෙන් (හා විකිරණයෙන්) මුළුමනින් ම ඈත්කිරීමක් අපෙන් නො සිදුවෙයි. ඩෙකාටෙ විද්වතා මනස ද්‍රව්‍යයෙන් වෙන්කිරීම හැඳින්වෙන්නේ මනස හා ද්‍රව්‍යය අතර තාප්පයක් බැඳීමක් ලෙස ය. එය අද බටහිර දර්ශනයෙහි කාටීසීය තාප්පය (Cartesian Wall) ලෙස හැඳින්වෙයි. ඒ අනුව බටහිර දර්ශනයෙහි මනසක් සහිත නිරීක්ෂකයා තාප්පයෙන් එක් පැත්තක සිට අනෙක් පැත්තෙහි ඇති ද්‍රව්‍යය (නිරීක්ෂ්‍යය) නිරීක්ෂණයකරයි. නිරීක්ෂකයා නිරීක්ෂණයකරන්නේ නිරීක්ෂකයාගෙන් තොරව, එනම් මනසින් තොරව පවතින දෑ ය. නිරීක්ෂකයා සිටියත් නැතත්, නිරීක්ෂකයා නිරීක්ෂණය කළත් නැතත් නිරීක්ෂ්‍යය පවතියි. නිරීක්ෂකයා කරන්නේ ඔහුගෙන් තොරව පවත්නා දෙයක් නිරීක්ෂණයකිරීම ය. එමෙන් ම එසේ නිරීක්ෂණයකිරීමේ දී ඔහු නිරීක්ෂ්‍යයට කිසිම බලපෑමක් නො කරයි.

ඩෙකාටෙ විද්වතාගේ දර්ශනය නිව්ටෝනීය භෞතික විද්‍යාව සමග එකඟවන නමුත් ක්වොන්ටම් භෞතික විද්‍යාවට පටහැණිවෙයි. ක්වොන්ටම් භෞතික විද්‍යාවෙහි දී නිරීක්ෂකයාගෙන් තොරව පවත්නා නිරීක්ෂ්‍යයක් නො වෙයි. නිරීක්ෂකයාගේ නිරීක්ෂණය නිසා ම නිරීක්ෂ්‍යයට යම් යම් ගුණ ලැබෙයි. එනම් නිරීක්ෂකයාට නිරීක්ෂණය කළහැකි ගුණ ලැබෙයි. ඒ ගුණ නිරීක්ෂ්‍යයෙහි “ස්වාභාවික” වූ ද නිරීක්ෂ්‍යයට අයත් වූ ද ගුණ නොව නිරීක්ෂකයා නිරීක්ෂ්‍යයෙහි ඇතැයි නිරීක්ෂණයකරන ගුණ වෙයි.

© Prof. Nalin De Silva

ඉහත සඳහන් කරුණුවලින් අප තේරුම්ගන්නේ නිරීක්ෂ්‍යය යන්න නිරීක්ෂකයාගේ නිර්මානයක් බව ය. එය ක්වොන්ටම් භෞතික විද්‍යාව ඉක්මවා යන තත්ත්වයකි. නිව්ටෝනීය භෞතික විද්‍යාවේ දී ද නිරීක්ෂ්‍යය යන්න නිරීක්ෂකයාගේ නිර්මානයක් වෙයි. අපට ඒ සියල්ල ලැබෙන්නේ බටහිර භෞතික විද්‍යාවකින් නොව පටිච්චසමුප්පවාදයෙන් ය. අවිජ්ජා පච්චයා සංඛාරා යන්න මුල්කරගෙන අපි නිර්මානාත්මක සාපේක්ෂතාවාදය නිර්මානය කෙළෙමු. (වැඩි විස්තර සඳහා “මගේ ලෝකය” කෘතිය කියවන්න.) මෙහි දී නිරීක්ෂකයා යන්නෙන් අදහස්කෙරෙන්නේ නිරීක්ෂකයාගේ මනස බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ඉන්පසු අපට ප්‍රශ්නය වූයේ මනස නිර්මානයකරන්නේ කවුද යන්න ය. අවශ්‍ය නම් එයට පිළිතුර ලෙස දෙවියන් වහන්සේ යැයි කිවහැකි ය. එහෙත් එවිට දෙවියන් වහන්සේ නිර්මානයකරනු ලැබුයේ කවුරුන් විසින් ද යන ප්‍රශ්නයට පිළිතුරුදීමට සිදුවෙයි. එයට පිළිතුර දෙවියන් වහන්සේ යැයි ගතහැකි නමුදු ඒ කෙරෙන්නේ කෙසේ ද යන්නට පිළිතුරක් ඉන් නො ලැබෙයි. මනස නිර්මානයකෙරෙන්නේ කවුරුන් විසින් ද යන ප්‍රශ්නයට අප දුන් පිළිතුර වූයේ මනස විසින් ම ය යන්න ය. එහෙත් එහි දී ද ඒ කෙරෙන්නේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුරුදීමට සිදුවෙයි. ඒ පිළිතුර චිත්ත ආශ්‍රයෙන් දී ඇත. මෙහි දී වැදගත්වනුයේ චිත්ත යන්න ද මනසේ නිර්මානයක් වීම ය. මනසින් තොර යමක් චිත්ත නමින් නැත. එමෙන් ම මනස සියුම් වූ හෝ නොවූ හෝ ද්‍රව්‍යයකින් හෝ විකිරණයකින් හෝ නිර්මානය වූවක් ද නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva